සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

8 ශ්‍රේණිය: ඉතිහාසය- 1 වාරය

1 පාඩම

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව

I කොටස - ජල තාක්ෂණය

සැකසුම:ආර්. ඩී. චන්දන මනෝජ්

බප/හො/ මදුරාවල මහා විද්‍යාලය

හැඳින්වීම

වසර 2500 ක් පමණ ලිඛිත ඉතිහාසයක් ඇති ලංකාව තුළ අපටම ආවේණික වූ ජල තාක්ෂණයක් බිහි විය.



“ මෙම දිවයිනේ වැස්සෙන් ලැබෙන ජලය මදකුත් ලෝකෝපකාරයෙන් තොරව මුහුදට නොයේවා”

ජල තාක්ෂණය හා වාරි මාර්ග



- අතීත ජනයාට පැමිණි අභියෝග ජය ගැනීමට සාම්ප්‍රදායික දැනුම පරපුරෙන් පරපුරට දියුණුවෙමින් ජලාශ්‍රිත නිර්මාණ බිහි විය.
- මුල් කාලීනව අවශ්‍යතාවය අනුව ජනයා **ගම් වැව්** නිර්මාණය කර ඇත.
- ලිඛිත සාක්ෂි අනුව පණ්ඩුකාභය රජුගේ සිට වැව් නිර්මාණයට රාජ්‍ය අනුග්‍රහය ලැබුණි. එකල ප්‍රමාණයෙන් **කුඩා වැව්** නිර්මාණය විය.
- මහ වැව් තැනීමේ ආරම්භකයා **වසභ රජු** විය.
- පොළොන්නරු යුගය වාරි තාක්ෂණයේ දියුණුතම අවධිය විය.
- පොළොන්නරු යුගයෙන් පසු කාලිංග මාඝ ආක්‍රමණයත් සමග වාරි තාක්ෂණය පරිහානියට පත් විය.

වැව් නිර්මාණයට හේතු

- කෘෂිකාර්මික කටයුතු හා ජල අවශ්‍යතාවය වැඩිවීම.
- ජනයාගේ පරිභෝජන අවශ්‍යතා සඳහා වියළි කලාපයේ වැසි ජලය එක් කාල පරිච්ඡේදයක දී පමණක් ලැබීම.
- ගංවතුර පාලනය

වැව් දියුණුවීමට හේතු

- ජනගහණය වර්ධනයවීම
- රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- දියුණු තාක්ෂණික ක්‍රම සොයා ගැනීම.

වැව් නිර්මාණයේ දී මුහුණු දුන් අභියෝග හා ජයගත් ආකාරය

- **සුදුසු භූමියක් තෝරා ගැනීම.**

  සුදුසු කදුවැටි දෙකක් තෝරා ගැනිම.

- **ශක්තිමත්ව ඉහළ ප්‍රමිතියෙන් වැව් බැම්ම නිර්මාණය කිරීම.**

  භූමිය පිහිටි ගල තෙක් පාදා එතැන් සිට වැව් බැම්ම පස් තට්ටු යොදා තලා නිර්මාණය

- **වැව් නිර්මාණයට අවශ්‍ය ප්‍රමාණය ශ්‍රමය සපයා ගැනිම.**

  සැලසුම් සහගතව හා සංවිධානාත්මකව කටයුතු කිරීම.

- **වැව් තනවා පවත්වාගෙන යාම**

  වැවට නව අංග එකතු කිරිම.

වැවක ප්‍රධාන අංග



සොරොව්ව

සොරොව්ව

මඩ සොරොව්ව

වැවෙහි පතුල් මට්ටමෙහි නිමවා ඇත. වැවෙහි මඩ ඉවත් කර වැව ප්‍රතිසංස්කරණයට මෙය උපකාරී වේ.

ගොඩ සොරොව්ව

මඩ සොරොව්වට තරමක් උඩින් නිමවා ඇත.

බිසෝකොටුව

- වැව් බැම්ම සමීපව මෙය නිමවා ඇත.
- වැව් බැම්ම හරහා නළයකින් ජලය පාලනයකින් පිට කිරීම සිදු වේ.
- වැව් බැම්මට වන ජල පීඩනය වළක්වයි.



රළපනාව

- වැව් බැම්ම ඇතුල් පැත්තේ ගල් අතුරා නිමවා ඇත.
- වැව් දියරැළිවලින් වැව් බැම්ම ආරක්ෂා කරයි.

පිටවාන

- වැවෙහි අතිරික්ත ජලය පිට කිරිම සිදු කරයි.
- වැව් බැම්මට ආරක්ෂාව සැපයේ.

ඇතුළුවාන

- වැවට ජලය බැහැරින් ගලා එන ස්ථානය යි.
- මෙය වැසීමෙන් වැවට ගලා එන රොන් මඩ ඉවත් කිරීම සිදු කිරීම.

රජු	වැවේ පැරණි නම	වර්තමාන නම	ඉදි කළ වැව් ප්‍රමාණය	ඇළ මාර්ග
පණ්ඩුකාභය	ජය වාපි, ගාමිණී වාපි අභය වාපි	බසවක්කුලම	03	
දේවානම්පියතිස්ස	තිසා වැව			
වසභ	මයෙත් වැව	මහවිලච්චිය වැව	11	ඇළහැර ඇළ
	මානික්විටි වැව (මහානික්කවට්ටි වැව)	මානන්කට්ටි වැව		
මහසෙන්	මණිහිර ජල්ලුරවාපී බානු වාපි	මින්නේරිය හුරුළු වැව මහකනදරා වැව	16	තීලවත්ථු (තල්වතු ඇළ)
ධාතුසේන	කලා වැව පාදුලකවාපි මහාදත්තවාපි	මඩාටුගම	18	ජය ගග (යෝධ ඇළ)
පළවන අග්බෝ පරාක්‍රමබාහු රජු	පරාක්‍රම සමුද්‍රය		163	මිනිපේ ඇළ

වැඩිදුර තොරතුරු සඳහා

ඇළහැර ඇළ තැනවීමෙ දී මුහුණු දුන් අභියෝග ජයගත් ආකාරය පිළිබඳ **ආර්. එල්. බ්‍රෝහියර් මහතා විසින් රචිත ලක්දිව පුරාතන වාරිමාර්ග කෘතිය** වැදගත් වේ.

ඇළ මාර්ග තැනීමේ අවශ්‍යතාව



අමුණු

- ස්ථාවර වේළි
- තාවකාලික වේළි

ඇළ මාර්ග තැනීමේ දී අභියෝග

- **භූ විෂමතාවයේ පවතින බාධක** - පස ලිහිල් තැන්වලට ගල් බැමි යෙදීම, සොරොව් ගල් බැමි සැකසීම.

- **නිවැරදි මිනුම් ලබා ගැනීම** - මුල් සැතපුම් 7 තුළ සැතපුමකට අගලක බැස්මකින් නිර්මාණය කර ඇත. (ජය ගග හෙවත් යෝධ ඇළ)

පොකුණු නිර්මාණය

මිනිසාගේ අවශ්‍යතාවයන් සඳහා ජලය එක් රැස් කර තබා ගැනිමට පොළව කැණ තනවා ඇති නිර්මාණය විශේෂය කි.

පොකුණු වර්ග හා ප්‍රයෝජන

ජල පරිභෝජනය

- ඇත් පොකුණ(අභයගිරිය)
- කුට්ටම් පොකුණ
- රන්මසු උයනේ පොකුණු

අලංකාරය

- කුමාර පොකුණ
- කුට්ටම් පොකුණ
- නෙළුම් පොකුණ

පරිසරය සිසිල් කිරීම

- අභයගිරි විහාරයේ පොකුණු
- කුට්ටම් පොකුණ
- අම්පාර රජගල පුරාවිද්‍යා භූමියේ පොකුණු

පොකුණු නිර්මාණයේ ලක්ෂණ හා තාක්ෂණය

- ආරාම සංකීර්ණවල පිටවන වැසි ජලය පොකුණුවලට එක් රැස් කිරීම.
- උමං මගින් ජලය ලබා ගැනීම හා පිට කිරීම.
- ජල පෙරන මගින් පොකුණට මඩ ඒම වැළැක්වීම.
- පොකුණ වටේ ශෛලමය පඩි පේළි මගින් පොකුණට බැසීමට හැකියාව
- පොකුණ අපවිත්‍රවීම වැළැක්වීමට පා දෝවනයන් පොකුණ අසල තැනවීම.
- සමචතුරස්‍ර, සෘජුකෝණී,
- රවුම් හැඩැති පොකුණු නිර්මාණය



ජල උද්‍යාන



ජල උද්‍යාන

රාජකීය උද්‍යාන

*රන්මසු උයන

*සීගිරිය

භාවිතය:

***විවේකය ගත කිරීම හා ජල ක්‍රීඩා කිරීමට**

ආරාමික උද්‍යාන

*මහමෙවුනා උයන

*මහාවිහාරය

*අභයගිරිය

*ජේතවනය

භාවිතය:

***විවේකිව බණ භාවනා කිරීමට**

උද්‍යාන තැන වූ රජවරු

- මුටසීව රජු → මහාමේඝ වනය (මහමෙවුනා උයන)
- කූටකණ්ණ තිස්ස → පද්මස්වර උයන
- කාශ්‍යප රජු → සීගිරි උද්‍යානය
- වසභ රජු
- ගෝඨාභය රජු
- පළමුවන අග්බෝ රජු
- පළමුවන පරාක්‍රමභාහු

උද්‍යානයන්හි අංග

- කුඩා එළිමහන් ගෙවල්
- මණ්ඩප
- ස්නානාගාර
- වැතිර සිටින ගල් යහන්

සීගිරි ජල උද්‍යානය

- දකුණු ආසියාවේ ඇති පැරණිතම එක් ජල උද්‍යානය කි.
- එච්. සී. පී. බෙල් සහ සෙනරත් පරණවිතාන යන පුරාවිද්‍යාඥයින් වල් බිහි ව ගිය මෙම ජල උද්‍යානය නැවත සොයා ගෙන ඇත.

සීගිරි ජල උද්‍යානයේ ඇති අංග

- මණ්ඩප
- පොකුණු
- ජලමල්
- විවේකස්ථාන
- මාර්ග පද්ධති
- ජලකාණු පද්ධති

උද්‍යාන තාක්ෂණය

- වැව් ජලය උමං මගින් උද්‍යානයේ පොකුණුවලට ජලය සපයා ඇත.
- ඉහළ සිට කාණු පද්ධතිය ඔස්සේ අධි පීඩනයකින් ගලා එන ජලය හරස්කොට සිදුරු විදින ලද වෘත්තාකාර ගල් පතුරු සවි කිරීමෙන් සීගිරි ජල මල් නිර්මාණය කිරීම.
- උද්‍යාන නඩත්තු කිරීම සඳහා උද්‍යාන පාලකයින් (උයන්කැමි/උයන්වැජැරුම) යෙදවීම.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	1	1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව I කොටස - ජල තාක්ෂණය ඇගයීම

සැකසුම - **ආර්. ඩී. චන්දන මනෝජ්**

බප/හො/ මදුරාවල මහා විද්‍යාලය

(1) හිස්තැන් පුරවන්න

1. ජය වාපි, අභය වාපි, ගාමිණි වාපි ලෙස හැඳින්වෙන වැව් කරවන ලද්දේ ..... විසින් ය.
2. මහවැව් තැනීම ආරම්භ කළ හා වැව් 11ක් හා ඇළ වල් 12ක් කළ රජු..... ය.
3. මින්නේරිය වැව සමග වැව් 16 ක් කළ රජු ..... ය.
4. කලා වැව සමග වැව් 18 කළ රජු..... ය.
5. පරාක්‍රම සමුද්‍රය හා මහ වැව් 163 කළ රජු..... ය.

(මහසෙන් රජු , වසභ රජු, ධාතුසේන රජු, පණ්ඩුකාභය රජු , පරාක්‍රමබාහු රජු)

(2) පැරණි නමට සමාන වර්තමානයේ භාවිතා වන නම යා කරන්න.

<u>පැරණි නාම</u>	<u>වර්තමාන නාම</u>
අභය වැව	මහකනදරා වැව
මයෙත් වැව	හුරුළු වැව
මානික්විටි වැව	මහවිලච්චිය වැව
මණිහිර වැව	මානන්කට්ටිය වැව
ජල්ලුරවාපි	මින්නේරිය වැව
බානු වාපි	බසවක්කුලම වැව

(3) හිස්තැන් පුරවන්න

1 ..... හෙවත් ඇළහැර ඇළ වසහ රජු විසින් කරවන ලදී.

2 ..... වැවට ජලය ලබාගැනීමට තිලවත්ථුක හෙවත් තල්වතු ඇළ මහසෙන් රජු විසින් කරවන ලදි.

3 ..... හෙවත් යෝධ ඇළ, තිසා වැවට ජලය ගෙනයාමට ධාතුසේන රජු කරවන ලදි.

4 .....සිට ජලය ගෙන යාමට මිණිපේ ඇළ 1අග්බෝ රජු විසින් කරවන ලදි.

5.....අමුණේ සිට ආරම්භ වන ඇළ මගින් මන්නාරමේ යෝධ වැවට ජලය ගෙන ලදි.

[තේක්කම්, ආළිසාර, මින්නේරි, මහවැලි ගගේ, ජය ගග]

(4) හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න

1. මඩ සොරොව්ව හා ගොඩ සොරොව්ව වශයෙන් වැවක සොරොව් වර්ග 2 කි. ( )

2. කුඩා වැව්වල බිසෝ කොටුවක් නොමැතිව සොරොව්ව මගින් ජලය පිටතට ගනු ලැබේ. ( )

3. වැව් බැම්ම සමීපව බිසෝ කොටුව තනවා ඇත. ( )

4. රලපනාව මගින් වැව් බැම්ම සේදී යාම වලක්වයි. ( )

5. වැවේ අතිරික්ක ජලය ඇතුලුවාන මගින් ඇළ මාර්ග වලට මුදා හැරේ. ( )

(5) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) භික්ෂූන්ගේ ජල පරිහරණය, අලංකාරයට හා පරිසරය සිසිල්ව තබා ගැනිම යන අරමුණු තුනම ඉටුවූ පොකුණකි.

1. කුට්ටම් පොකුණ
2. කුමාරපොකුණ
3. නෙලුම් පොකුණ
4. ඇත් පොකුණ

2) මේ දිවයිනේ වැස්සෙන් ලැබෙන ජලය මදකුත් ලෝකෝපකාරයෙන් තොරව මුහුදට නොයේවා යන ප්‍රකාශය කළ රජු

1. දුටුගැමුණු රජු
2. පළමුවන පරාක්‍රමබාහු රජු
3. දෙවන පරාක්‍රමබාහු රජු
4. හයවන පරාක්‍රමබාහු රජු

3) මෙරට ලිඛිත ඉතිහාසයට වසර කියද ?

1. අවු:2500 කි
2. අවු:250000කි
3. අවු.5000 කි
4. අවු .28000 කි

4) ලක්දිව පුරාතන වාරි මාර්ග කෘතිය රචනා කළේ

1. ෆෙඩ්‍රික්නෝර්ත්
3. ෆාහියන් හිමි
2. ආර්.එල්.බ්‍රොහියර්
4. රොබට් නොක්ස්

5) සෙනරත් පරණවිතාන හා එච්.සී.පී බෙල් පුරාවිද්‍යාඥයින් සොයාගන්නා ලද්දේ,

1. මහමෙව්නා උයන
3. සිගිරි ජල උයන
2. රන්මසු උයන
4. නන්දන උයන

(6) කෙටි පිළිතුරු සපයන්න.

1. මෙරට අතීත ජනයාගේ ජල අවශ්‍යතාවය සපුරා ගැනීමට ඉදි කළ නිර්මාණ තුනක් ලියන්න.
2. වැව් තැනීමේදී මුහුණ දුන් අභියෝග 03 ක් ලියන්න.
3. වැවක ප්‍රධාන අංග 05 ක් ලියන්න.
4. පැරණි ජනයාට ඇළවල් තැනවීමේ අවශ්‍යතාවය මතුවූයේ ඇයි කරුණු 03 ක් ලියන්න.
5. ජය ගඟ නම් වූ නිර්මාණයේදී බිම් මැනීමේ විශිෂ්ට දැනුම භාවිතා කර ඇත්තේ කෙසේද
6. පොකුණු තැනීමෙන් පැරණි ජනයා ලබාගත් ප්‍රයෝජන 04 ක් ලියන්න.
7. පොළොව කැන තැනු පොකුණුවල යොදා ගත් හැඩයන් 03ක් ලියන්න.
8. මෙරට අතීතයේ රජවරු නිර්මාණය උයන් 03 ක් හා ඒවා කළ රජවරුන්ගේ නම් ලියන්න.
9. ජල උද්‍යානයක දැකගත හැකි අංග ලියන්න.
10. සීගිරි ජල මල් තැනීමේ දී යොදාගත් තාක්ෂණය පිළිබඳ කෙටියෙන් ලියන්න.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	1	1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව I කොටස - ජල තාක්ෂණය ඇගයීම

සැකසුම - **ආර්. ඩී. චන්දන මනෝජ්**

බප/හො/ මදුරාවල මහා විද්‍යාලය

(1)1. පණ්ඩුකාභය රජු
2. වසභ රජු
3. මහසෙන් රජු
4. ධාතුසේන රජු
5. 1 පරාක්‍රමබාහු රජු

(2)1. බසවක්කුලම
2. මහවිලච්චිය
3. මානන්කට්ටිය
4. මින්නේරිය
5. හුරුලු වැව
6. මහකනදරා වැව

(3)1. ආළිසාර
2. මින්නේරිය
3. ජය ගග
4. මහවැලි ගගේ
5. තේක්කම්

(4) 1. √
2. √
3. √
4. √
5. ×

(5) 1. 1
2. 2
3. 1
4. 2
5. 3

(6) 1. වැව්, අමුණු, ඇළවල්, පොකුණු

2.

1. ඉතා ශක්තිමත් ව ඉහළ ප්‍රමිතියෙන් වැව් බැම්ම සැකසීම.
2. වැව තැනීමට අවශ්‍ය ශ්‍රමය සපයා ගැනීම.
3. වැව තනවා පවත්වාගෙන යාම.
4. සුදුසු භූමියක් තෝරා ගැනීම.

3. රළපනාව, බිසෝකොටුව, සොරොව්ව, පිටවාන, වැව් බැම්ම

4. ජය ගගේ මුල් සැතපුම් 17 තුළ ජල බැස්ම සැතපුමකට අගලක පමණ බැස්මක් පවත්වා ගැනීම.

5.

1. වැවකින් හෝ අමුණකින් වගා බිම්වලට ජලය ගැනීමට.
2. වැවකට ගගකින් ජලය ගැනිමට
3. වැවකින් තවත් වැවකට ජලය ගැනිමට

6.

1. ස්නානය හා ජල ක්‍රීඩා කිරීමට
2. අලංකාරය සඳහා
3. පරිසරය සිසිලස පවත්වා ගැනිමට
4. භූමියේ ජලවහනය ක්‍රමවත් කිරීමට

7. සමචතුරස්‍ර, ඍජුකෝණාස්‍ර, රවුම් හැඩ

8.

1. මහාමේඝ වනය - මුටසීව රජු
2. පද්මස්වර උයන - කූටකණ්ණතිස්ස රජු
3. සීගිරි උද්‍යාලය - පළවන කාශ්‍යප රජු

9. ස්නානාගාර, ජලමල්, පොකුණු, මණ්ඩප, විචිත්‍රවත් පියසි

10. අධික පීඩනයෙන් ඉහළ සිට ගලා බසින ජලය හරස් කර සිදුරු විදින ලද රවුම් ගල් පතුරු යෙදීමෙන් ජලමල් නිර්මාණය කර ඇත.

8 ශ්‍රේණිය: ඉතිහාසය - 1 වාරය

1 පාඩම: ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික තාක්ෂණය හා කලාව

II කොටස- මැටි තාක්ෂණය



සැකසුම: එච්.කේ. විපුලි මංගලා
බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

මැටි කර්මාන්තය:

- ආදි මානවයාගේ ප්‍රමුඛතම කර්මාන්තය වීම
- මැටි පහසුවෙන් සොයා ගත හැකි වීම හා පහසුවෙන් වැඩ කළ හැකි වීම

මැටි භාණ්ඩ තැනීමේ ප්‍රාථමික අවධිය

- අතින් තැනූ භාජන අවුවේ වියළා ශක්තිමත් කිරීම
- පසු කාලීනව ගින්නෙන් වියළා සවිමත් කර ගැනීමේ තාක්ෂණයට යොමු වීම

➢ ශිෂ්ටාචාර බිහිවීම හා මැටි කර්මාන්තයේ ප්‍රගතිය

❖ **සකපෝරුව භාවිතයට යොමු වීම.**

- යම් ආකෘතියක් මත පහසුවෙන් කරකැවිය හැකි ලෑල්ලකි.
- වෘත්තාකාර ලෑලි පුවරුව මත මැටි ගුලිය තබා කරකැවීමෙන් උසස් නිමාවකින් යුතු භාජන තැනිය හැකි වීම.

➢ අවශ්‍යතා අනුව විවිධ භාජන හා මැටි භාජන සැකසීම

- හැලි වලං
- මැටි කෝප්ප
- පිඟන්
- මල් බඳුන්
- ජලය රැස්කර තබා ගන්නා භාජන



➢ මැටි භාජන අලංකරණය

- වර්ණ ගැන්වීම
- පින්තාරු කිරීම
- භාජන මත මෝස්තර රටා ඇඳීම

➢ මහින්දාගමනය හා ශ්‍රී ලංකාවේ මැටි කර්මාන්තයේ ප්‍රගතිය

- කුඹල් කුල අටක් පැමිණීම
- අනුරාධපුර යුගයේ මුල් අවධියේ සිටම මැටි භාජන තැනීම දියුණු මට්ටමක පැවතීම

➢ මැටි භාජන තැනීමේ පියවර.

- ❖ සුදුසු මැටි වර්ගයක් තෝරාගෙන පදම් කිරීම.
- ❖ සකපෝරුව මත තබා භාජනයේ හැඩය සකස් කරීම.
- ❖ අලංකාර කිරීම.
- ❖ වියළුණු භාජනය පෝරණුවේ තැන්පත් කර පිළිස්සීම.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	1	1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව II කොටස - මැටි තාක්ෂණය ඇගයීම

සැකසුම: එච්.කේ. විපුලි මංගලා

බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

1. ආදි මානවයාගේ ප්‍රමුඛතම කර්මාන්තය බවට පත්වූයේ කුමක්ද?
2. මැටි භාණ්ඩ තැනීමේ ප්‍රාථමික අවස්ථාවේදී සිදු කළ කාර්යයන් 2 ක් ලියන්න.
3. ශිෂ්ටාචාර බිහිවීමත් සමඟ මැටි තාක්ෂණයේ සිදු වූ වෙනස්කම් 2 ක් ලියන්න.
4. සකපෝරුව යනු කුමක්ද?
5. ශ්‍රී ලංකාවේ මැටි නිර්මාණ කලාවේ උන්නතියට බලපෑ ඓතිහාසික සිදුවීම කුමක්ද?
6.

   i. **රූපයේ දැක්වෙන්නේ කුමක්ද?**

   ii. **එය සකස් කර ඇත්තේ කුමන යුගයකදී ද?**

   iii. **මෙම නිර්මාණයට අනුව පැරණි මැටි තාක්ෂණය පිළිබඳ කළ හැකි ප්‍රකාශය කුමක්ද?**

7. **මැටි භාජන තැනීමේ ක්‍රියාවලිය පියවර 4 න් ලියන්න.**

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	1	1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව II කොටස - මැටි තාක්ෂණය පිළිතුරු

සැකසුම: එච්.කේ. විපුලි මංගලා

බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

1. මැටි කර්මාන්තය
2. සකපෝරුව නොමැති නිසා අතින් මැටි භාජන සැකසීම, මැටි භාජන අව්වේ වියළා ශක්තිමත් කර ගැනීම
3. සකපෝරුව භාවිතයට යොමු වීම, මැටි භාජන අලංකරණය කිරීම
4. පොළවේ හෝ කිසියම් ආකෘතියක් මත පහසුවෙන් කරකැවීමට හැකි ලෙස තැනූ වෘත්තාකාර ලෑල්ලකි
5. ශ්‍රී මහ බෝධිය මෙරටට වැඩමවීමේදී මැටි භාණ්ඩ තැනීමට නිපුණත්වයක් දැක්වූ කුඹල් කුල අටක් පැමිණීම
6. i. මැටි බඳුනක්

   ii. අනුරාධපුර යුගයේදී

   iii. මැටි තාක්ෂණය ඉතා දියුණු මට්ටමක පැවතීම
7. * සුදුසු මැටි වර්ගයක් තෝරා ගෙන මැටි පදම් කිරීම

   * මැටි පිඬ සකපෝරුව මත තබා භාජනයේ හැඩය සැකසීම

   * කැටයම් හෝ ඉරි රටා ඇඳ බඳුන අලංකාර කිරීම

   * වියළුණු භාජන පෝරණුවේ තැන්පත් කර පුළුස්සා ගැනීම

8 ශ්‍රේණිය: ඉතිහාසය- 1 වාරය

1 පාඩම: ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික තාක්ෂණය හා කලාව

III කොටස-ගඩොල්,උළු නිෂ්පාදනය සහ ලෝහ තාක්ෂණය

සැකසුම: එච්.කේ. විපුලි මංගලා
බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

ගඩොල් නිෂ්පාදනය

➢ ගඩොල් භාවිතයේ ඉතිහාසය

- ක්‍රි.පූ.3 වන සියවසේ සිට ගඩොල් භාවිත කිරීම
- අනුරාධපුර යුගයේ රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනය වැනි දාගැබ් සෑදීමට ගඩොල් භාවිත කර තිබීම
- පොළොන්නරු යුගයට අයත් පරාක්‍රමබාහු රජ මාලිගය ගඩොල් භාවිතයෙන් ඉදි කිරීම



➢ අනුරාධපුර රාජ්‍ය සමයේ ගඩොල් වල ස්වරූපය

- ප්‍රමාණයෙන් විශාල වීම
- වතුර උරා ගැනීමේ ස්වභාවය අවම වීම
- ගඩොලේ ශක්තිමත් භාවය වැඩි වීම
- බර දරා ගැනීමේ හැකියාව අධික වීම



➢ ජේතවන දාගැබ සංරක්ෂණය සඳහා ගඩොල් නිපදවීම

- අතීත ගඩොල්වල ශක්තිමත්භාවය නොඉක්මවා යන ප්‍රමිතියකින් යුතු ගඩොල් තැනීමේ අවශ්‍යතාව මතු වීම
- 1990-91 කාලයේ දී මධ්‍යම නුවරගම් පළාතේ ගල්කඩවල නම් ග්‍රාමයේ ගඩොල් පෝරණුවක් ඉදි කර ගඩොල් නිෂ්පාදනය කිරීම

උළු නිෂ්පාදනය

- රජරට ශිෂ්ටාචාර සමයේ වහල සෙවිලි කිරීමට උළු භාවිත කර ඇත.
  - ආගමික ගොඩනැගිලි
  - පොදු ගොඩනැගිලි
  - රජ මාලිගා
  - ප්‍රභූ නිවාස

➢ උළු නිෂ්පාදනයේ පියවර

- සුදුසු මැටි වර්ගය තෝරා පදම් කිරීම
- අව්වුව යොදාගෙන උළුවල හැඩය සකසා ගැනීම
- උළු වියළීම හා පිළිස්සීම

➢ උළු වඩුවන් යනු

- උළු නිෂ්පාදනයේ යෙදුණු ශිල්පීන්
- ගඩොල් නිෂ්පාදනයේ යෙදුණු ශිල්පීන්

ලෝහ තාක්ෂණය

➢ ශ්‍රී ලංකාවේ ලෝහ භාවිතයේ ඉතිහාසය

- ක්‍රි.පූ.3 වන සියවසට පෙර කාලයේදීත් ලෝහ භාවිත කර තිබීම
- යකඩ හා තඹ වැනි ලෝහ වර්ග භාවිතකර තිබූ බවට පුරාවිද්‍යාත්මක සාක්ෂි හමුවීම

➢ ලෝහ තාක්ෂණයේ හා භාවිතයේ ශීඝ්‍ර දියුණුවක් ඇති වීම

- ක්‍රි.පූ.3 වන සියවසේ සිට කෘෂි කර්මාන්තය පුළුල් වීම
- නාගරීකරණය වේගවත් වීම
- ඉදිකිරීම් ක්ෂේත්‍රය වර්ධනය වීම
- ඉන්දියානු තාක්ෂණික ශිල්ප ක්‍රම ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වීම
- ලෙන් ලිපි ලිවීම හා ගල්ලෙන්වල කටාරම් කෙටීම



➢ රජරට ශිෂ්ටාචාර සමයේ පැවති ලෝහ කර්මාන්තය

- නිර්මාණකරණයට භාවිත කළ ලෝහ වර්ග

  *යකඩ *ලෝකඩ * රත්රන්

  *තඹ * රිදී

- යකඩ,තඹ හා රිදී ආදී ලෝහ වර්ග මෙරටින් සපයාගෙන ඇත
- රත්රන් වැනි ලෝහ වර්ග පිටරටින් ආනයනය කර ඇත



➢ ශිලා ලිපිවල ලෝහ කර්මාන්තයේ නියළුණු ශිල්පීන් හඳුන්වා දී ඇති ආකාරය

කබර ,කම්මාර - ලෝහ වැඩ කරන්නා

තඹර - තඹකරු

තොපඹ - බෙලෙක් වැඩ කරන්නා

රන් කර්මාන්තය

- අනුරාධපුර සමයේ දී රන් කර්මාන්තය දියුණු මට්ටමක පැවතුනි
  - අභයගිරි විහාර භූමියේ කැණීම් කිරීමේදී රනින්කළ නිර්මාණ හමුවීම

*රන් වළලු *සලඹ *රන්මුදු

*රන් කර්ණාභරණ *රන් මාලය

- අභයගිරි විහාර භූමියේ පොකුණක් කැණීමේදී රන් කර්මාන්තය ආශ්‍රිතව කළ නිර්මාණ හමුවීම

* 370g -438g දක්වා බරින් යුතු රන් කැබලි 5ක් හමුවීම
* රන් කහවණු කිහිපයක් හමුවීම
* රන් කර්මාන්ත ශාලාවක් තිබූ බවට සාක්ෂි ලැබීම

යකඩ කර්මාන්තය

- ක්‍රි.පූ. තුන්වන සියවසෙන් පසු කාලයේ ශ්‍රී ලංකාව පුරා යකඩ භාවිතය පැවතුණි

➢ යකඩ භාවිතය අත්‍යවශ්‍ය වීමට හේතු

- කෘෂි කාර්මික උපකරණ සැකසීම
- අවි ආයුධ තැනීම
- යකඩ ඇණ සැකසීම ආදී අවශ්‍යතා සඳහා

- යකඩ නිස්සාරණයට යොමු වීම

යකඩ නිස්සාරණ ක්‍රියාවලිය

යකඩඅඩංගු ස්වභාවික ගල්

↓

කැබලබවට පත් කිරීම

↓

මැටියෙන් තැනූ උදුන්වලට දැමීම

↓

අවශ්‍ය උෂ්ණත්වය ගින්නෙන් ලබා දීම

ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කළ බවට සාක්ෂි හමු වූ ස්ථාන

- බළංගොඩ සමනළ වැව ප්‍රදේශයේ උඳුන

  ස්වභාවික සුළං බලය උපයෝගී කරගෙන ඇත

- සීගිරියේ අලකොළ වැව දෙහිගහ ඇළකන්ද ප්‍රදේශයේ උඳුන

  මයිනහම යොදාගෙන දැල්වීම සිදු කර ඇත

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	1	1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව III කොටස - ගඩොල්, උළු නිෂ්පාදනය සහ ලෝහ තාක්ෂණය ඇගයීම

සැකසුම: එච්.කේ. විපුලි මංගලා

බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

1. අනුරාධපුර යුගයේ ගඩොල් උපයෝගී කරගෙන තැනවූ විශිෂ්ඨ නිර්මාණ 2ක් නම් කරන්න.
2. අනුරාධපුර රාජ්‍ය සමයේ මුල් භාගයේ භාවිත කළ ගඩොල් වල විශේෂතා 2ක් ලියන්න.
3. ජේතවන දාගැබ සංරක්ෂණයට අවශ්‍ය ගඩොල් සපයා ගත්තේ කෙසේද?
4. අතීතයේ ගඩොල් බහුලව යොදාගෙන ඉදිකළ ආගමික නොවන ගොඩනැගිල්ලක් නම් කරන්න.
5. ගඩොල් තැනූ පිරිස් එකළ හැඳින්වූයේ කුමන නමකින්ද?
6. වහලය සෙවිලි කිරීමට උළු භාවිත කළ ගොඩනැගිලි වර්ග 2ක් නම් කරන්න.
7. අතීත ශ්‍රී ලංකාවේ ලෝහ තාක්ෂණයේ හා ලෝහ වර්ග භාවිතයේ ශිඝ්‍ර දියුණුවක් ඇති වීමට බලපෑ හේතු 2ක් ලියන්න.
8. මෙරට ලෝහ කර්මාන්තය සඳහා යොදා ගත් ලෝහ වර්ග 2 ක් ලියන්න.
9. ශිලා ලිපිවල <u>කබර</u>, <u>තඹර</u> හා <u>තොපෂ</u> ලෙස හඳුන්වා ඇත්තේ කවුරුන්ද ?
10. අභයගිරි විහාර භූමිය කැණීම් වලින් හමු වූ රන් නිර්මාණ 3 ක් නම් කරන්න.
11. එම භූමියෙහි රන් කර්මාන්ත ශාලාවක් තිබූ බවට ලැබුණු සාක්ෂි මොනවාද ?.

12. අභයගිරි විහාර භූමියේ රන් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන්නට ඇත්තේ කුමක් සඳහාද?

13. යකඩ නිස්සාරණය සිදු කරන ආකාරය කෙටියෙන් ලියන්න.

14. ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කළ ආකාරය පිළිබඳ පැහැදිලි සාක්ෂි හමුවන ස්ථාන **2** ක් නම් කරන්න.

15. ඉන් එක් උඳුනක සුවිශේෂිතාවය කෙටියෙන් ලියන්න.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	1	1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව III කොටස - ගඩොල්, උළු නිෂ්පාදනය සහ ලෝහ තාක්ෂණය පිළිතුරු

සැකසුම: එච්.කේ. විපුලි මංගලා

බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

1. **රුවන්වැලි සෑය , ජේතවනය වැනි දාගැබ්**
2. **නූතන ගඩොල්වලට වඩා ප්‍රමාණයෙන් විශාල වීම, ගඩොල්වල වතුර උරා ගැනීමේ ස්වභාවය අවම වීම, ගඩොලේ ශක්තිමත් භාවය හා බර දරා ගැනීමේ හැකියාව අධික වීම.**
3. **1990-91 කාලයේ දී මධ්‍යම නුවරගම් පළාතේ ගල්කඩවල නම් ග්‍රාමයේ ගඩොල් පෝරණුවක් ඉදි කොට අවශ්‍ය ගඩොල් සපයා ගන්නා ලදි.**

4. පොලොන්නරුවේ පරාක්‍රමබාහු රජ මාලිගය.

5. උළු වඩුවන් නමින්.

6. ආගමික ගොඩනැගිලි, පොදු ගොඩනැගිලි, රජ මාලිගා, ප්‍රභූ නිවාස

7. කෘෂිකර්මාන්තය පුළුල් වීම,නාගරීකරණය වේගවත් වීම, ඉදිකිරීම් ක්ෂේත්‍රය වර්ධනය වීම, ඉන්දියානු තාක්ෂණික ශිල්ප ක්‍රම වේගයෙන් රට තුල ක්‍රියාත්මක වීම.

8. යකඩ, ලෝකඩ, තඹ, රිදී, රත්රන්

9. කබර-ලෝහ වැඩ කරන්නා.

තඹර -තඹකරු

තොපෂ-බෙලෙක් වැඩ කරන්නා

10. රන් වළලු, සලඹ, රන්මුදු, රන් කර්ණාභරණ, රන් මාලය

11. රන් උණු කිරීම සඳහා භාවිත කළ උඳුන්, ජලය තබා ගත් මැටි භාජන

12. විහාර භූමියේ ප්‍රතිමා වල රන් ආලේප කිරීමට, විවිධ අලංකාර භාණ්ඩ නිෂ්පාදනයට.

13. යකඩ අඩංගු ස්වභාවික ගල් කැබලි කොට, මැටියෙන් තැනූ උඳුන් වලට දමා උණු වීමට අවශ්‍ය උෂ්ණත්වය ගින්නෙන් ලබා දීම මඟිනි.

14. බලංගොඩ සමනල වැව ප්‍රදේශයෙන්, සීගිරියේ අලකොළ වැව දෙහිගහ ඇළකන්ද ප්‍රදේශයෙන්

15. බලංගොඩ සමනල වැව ප්‍රදේශයේ උඳුන- මෙම උඳුන්වල ගිනි දැල්වීමට යොදන අඟුරු අඛණ්ඩව දැල්වීමට මෝසම් සුළං කාලයට පවතින ස්වභාවික සුළං බලය උපයෝගි කර ගනී.

සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

8 ශ්‍රේණිය: ඉතිහාසය- 1 වාරය

1 පාඩම: ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික තාක්ෂණය හා කලාව

IV කොටස- වාස්තු විද්‍යාත්මක හා කලාත්මක නිර්මාණ

සැකසුම: එච්.කේ. විපුලි මංගලා

බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

➢ වාස්තු විද්‍යාත්මක නිර්මාණ

❖ **වාස්තු විද්‍යාව යනු ,**

නිවාස,ගොඩනැගිලි ආදී ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳ හදාරණ ශිල්ප ශාස්ත්‍රයකි

❖ **ශ්‍රී ලංකාවේ වාස්තු විද්‍යාවේ ප්‍රගතිය**

මහින්දාගමනයත් සමඟ ඉන්දියාවේ දියුණු වාස්තු විද්‍යාත්මක දැනුම මෙරටට ලැබුණි

➢ ගෘහ නිර්මාණ ශිල්පය

❖ රජරට ශිෂ්ටාචාර සමයට අයත් වාස්තු විද්‍යාත්මක නිර්මාණ

ගෘහ නිර්මාණ

ආගමික ගොඩනැගිලි

1. දාගැබ්
2. චේතියඝර
3. බෝධිඝර
4. පිළිම ගෙවල්
5. විහාර ආරාම
6. භාවනා කුටි
7. දානශාලා
8. දේවාල

ආගමික නොවන ගොඩනැගිලි

1. රජමාලිගා
2. බලකොටු
3. ආරෝග්‍යශාලා
4. නිවාස
5. වැසිකිළි - කැසිකිළි

➢ ආගමික ගොඩනැගිලි

දාගැබ්

- ❖ ශ්‍රී ලංකාවේ ඉදි කළ මුල්ම දාගැබ - ථූපාරාමය
- ❖ අනුරාධපුරයේ ඉදිකළ විශාල දාගැබ්

ථූපාරාමය

රුවන්වැලිසෑය

මිරිසවැටිය

අභයගිරිය

❖ අනුරාධපුර යුගයේ අගනගරයෙන් බැහැරව ඉදි කළ විශාල දාගැබ්

සෝමාවතිය

සේරුවාවිල

දීඝවාපිය

නීලගිරිය

❖ පොළොන්නරු යුගයේ ඉදිකළ විශාල දාගැබ්

පොළොන්නරුව කිරිවෙහෙර

❖ අනුරාධපුර යුගයේ මැද කාලය වන විට දාගැබක දැකිය හැකි වූ ප්‍රධාන අංග

* පාදම
* පේසාවළලු
* ගර්භය
* හතරැස් කොටුව
* දේවතා කොටුව
* කොත්කැරැල්ල
* කොත



❖ දාගැබක සෞන්දර්යාත්මක අගය වැඩි දියුණු කිරීම සඳහා දාගැබ් ආශ්‍රිතව සතර දිශාවට මුහුණ ලා ආයක (වාහල්කඩ) සතරක් ඉදි කර තිබීම

උදා: රජරට සමයට අයත් විශිෂ්ටතම ආයකය

* මිහින්තලේ කණ්ඨක චේතියේ ආයකය

චේතියඝර හෙවත් වටදාගෙවල්

❖ ප්‍රමාණයෙන් කුඩා දාගැබ් ආවරණය කිරීම සඳහා තැනූ ගෘහය

දාගැබ වටා ගල් කණු පේළි වශයෙන් සිටුවා ඒවා මත සවි කරන ලද පරාලවලින් කෝණාකාර වහලක් යොදා වටදාගෙය තනා ඇත.

උදා: මැදිරිගිරිය වටදාගෙය

(රජරට සමයට අයත් කලාත්මක වටදාගෙය)

චේතියඝරවල ඉතිරි වූ ගල් කණු දක්නට ලැබෙන දාගැබ්

ථූපාරාමය

ලංකාරාමය

අම්බස්ථල දාගැබ

තිරියාය

❖ශ්‍රී ලංකාවේ ඉදි වූ ප්‍රකට දාගැබ්

කාලය	දාගැබ	ඉදි කළ රජු
අනුරාධපුර යුගය	ථූපාරාමය	දේවානම්පියතිස්ස රජු
	රුවන්වැලි සෑය මිරිසවැටි	දුටුගැමුණු රජු
	අභයගිරිය	වළගම්බා රජු
	ජේතවනය	මහසෙන් රජු
පොලොන්නරු යුගය	පොලොන්නරු කිරිවෙහෙර දෙමළ මහ සෑය යුධගනාව දාගැබ දැදිගම කොටවෙහෙර	මහා පරාක්‍රමබාහු රජු
	රන්කොත් වෙහෙර	නිශ්ශංකමල්ල රජු

බෝධිඝර

❖ බෝධිඝර යනු,

බෝධි වෘක්ෂය මැදි කොට තැනූ ගෘහය.

❖ බෝධිඝර ඉදිකිරීමේ අරමුණු:

බෝධි වෘක්ෂයේ ආරක්ෂාවට හා අලංකාරයට

වන්දනාමාන කරන අයගේ ආරක්ෂාවට

❖ රජරට ශිෂ්ටාචාර සමයට අයත් කලාත්මක බෝධිඝරය

උදා:කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්කගම බෝධිඝරය

පිළිම ගෙවල්

- පිළිම ගෙවල් නිර්මාණය කිරීමේ අරමුණු:
  - * බුදු පිළිම වහන්සේ අව්, වැසිවලින් ආරක්ෂා කිරීම සඳහා
  - * වන්දනාමාන කරන ජනතාවගේ පහසුව සඳහා
- රජරට ශිෂ්ටාචාර සමයේ දී පිළිම ගෙවල් නිර්මාණය කළ ප්‍රධාන සම්ප්‍රදායන්
  - * ගන්ධ කුටි සම්ප්‍රදාය
  - * ගෙඩිගේ සම්ප්‍රදාය
  - * ලෙන් විහාර සම්ප්‍රදාය

1.ගන්ධ කුටි සම්ප්‍රදාය

- පැරණිම සම්ප්‍රදාය - ගන්ධ කුටි සම්ප්‍රදාය
- ගර්භ ගෘහය - ප්‍රතිමාව තැම්පත් කළ කොටස
- මණ්ඩපය - ජනතාවට ප්‍රතිමාව දැක බලා ගැනීමට තැනවූ කොටස

ගන්ධ කුටි සම්ප්‍රදායට නිදසුන්:

කිරිබත් වෙහෙර, විජයාරාමය, පංකුලිය, තොලුවිල

2.ගෙඩිගේ සම්ප්‍රදාය

- ගන්ධ කුටි සම්ප්‍රදායේ දියුණු අවස්ථාවකි
- බිත්ති හා පියස්ස ගඩොලින් හෝ ගලින් ඉදි කොට ඇත
- පොළොන්නරු යුගයේ මහා පරාක්‍රමබාහු රජුගේ කාලයේ මෙම සම්ප්‍රදායේ සුවිශේෂී දියුණුවක් ඇති විය
- ගෙඩිගේ සම්ප්‍රදායට අයත් අගනා නිර්මාණ

තිවංක පිළිමගෙය

ථූපාරාමය

ලංකාතිලකය

3 .ලෙන් විහාර සම්ප්‍රදාය

- ප්‍රධාන පිළිමය සැතපෙන ඉරියව්වෙන් නිර්මාණය කර ඇත

*ලෙන් විහාරවලට නිදසුන්

හබැස්ස

පිදුරංගල

බඹරගස්තලාව



විහාර ආරාම

❖ භික්ෂූන් වහන්සේලාට වැඩ විසීම සඳහා ආරම්භයේ දී ගල් ලෙන් සුදුසු පරිදි සකස් කර පූජා කරන ලදි

- කටාරම් කෙටීම
- කටාරමට පහළින් හා ලෙන ඉදිරිපසින් බිත්ති බැඳීම
- දැවයෙන් දොර කවුළු යෙදීම
- අතීතයේ භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කළ ලෙන්

* මිහින්තලය *වෙස්සගිරිය *රිටිගල *රජගල



❖ පසු කාලීනව රාජ්‍ය අනුග්‍රහය යටතේ විශාල විහාරාරාම ඉදි කොට භික්ෂූන් වහන්සේලාට පූජා කරන ලදි

- අභයගිරිය විහාරය
- ජේතවනාරාමය

දේවාල

❖ පොළොන්නරු අවධියේ දී ඉදිකළ හින්දු ආගමික දේවාල

*අංක Iහා II ශිව දේවාල

චෝල වාස්තු විද්‍යා ශෛලිය අනුව සම්පූර්ණයෙන් ගලින් නිමවා ඇත

➢ ආගමික නොවන ගොඩනැගිලි

❖ රජරට ශිෂ්ටාචාර සමයේ දී රාජකීයන්, ප්‍රභූන් සහ සෙසු ජනතාවගේ අවශ්‍යතා සඳහා විවිධ ගොඩනැගිලි ඉදි කෙරිණි

*රජ මාලිගා *බලකොටු *ආරෝග්‍යශාලා

*නිවාස *වැසිකිළි - කැසිකිළි

රජ මාලිගා

❖ සීගිරිය

* අනුරාධපුර සමයට අයත් සුවිශේෂී මාලිගා සංකීර්ණයක් ලෙස සීගිරිය හැඳින්විය හැකිය

* සීගිරිය කාශ්‍යප රජු විසින් කරවන ලදි ජල උද්‍යාන , ශිලා උද්‍යාන,දිය අගල්, ප්‍රාකාර බැමිවලින් අලංකාර කර ඇත.



❖ විජයබා මාලිගය

පොලොන්නරු යුගයට අයත් පැරණිම රජ මාලිගයයි

❖ වෛජයන්ති ප්‍රාසාදය

පොලොන්නරු යුගයට අයත් සුවිශේෂිම රජමාලිගය මෙයයි

* පළමු වන පරාක්‍රමබාහු රජුගේ නිර්මාණයකි
* මාලිගය මහල් හතකින් යුක්ත බව වංසකථා වල සඳහන් වේ.
* වර්තමානයේද මෙම මාලිගයේ මහල් තුනක සාධක හා ඉහලට නැගීමට ඉදිකර තිබූ පියගැට පෙළ දැකිය හැකිය
* පඩුවස් නුවරින් මෙම මාලිගයේ සැලසුමට සමානව ඉදි කළ කුඩා මාලිගයක නටබුන් හමු වේ.

➢ ආරෝග්‍ය ශාලා

❖ පුරාණ ආරෝග්‍ය ශාලා පැවති බවට සාධක හමු වූ ස්ථාන

පොලොන්නරුව ආළාහන පිරිවන

මැදිරිගිරිය , මිහින්තලය

❖ ආරෝග්‍ය ශාලාවක සමන්විතව තිබූ අංග

මැද මිදුල , නේවාසික කාමර

ගබඩා , බෙහෙත් නිෂ්පාදන ශාලාව

ගලින් කළ බෙහෙත් ඔරු

*පොලොන්නරුව ආළාහන පිරිවෙන් ගොඩනැගිලි අතරින්

වෛද්‍ය උපකරණ ද හමු වී ඇත

කැසිකිළි - වැසිකිළි

- පුරාණයේ ජනතාව සනීපාරක්ෂක කටයුතු කෙරෙහි දැඩි සැලකිල්ලක් යොමු විය

  * ඒ සඳහා ඉතා ක්‍රමවත් කැසිකිළි - වැසිකිළි ඉදි කිරීම

- කැසිකිළි - වැසිකිළි භාවිතයේ දී පරිසරය කෙරෙහි සැලකිලිමත් වීම

  * කැසිකිළියෙන් බැහැර වන අපජලය සෘජුව පොළවට මුදා නොහැර පිරිසිදු කර මුදා හැරීම

  * ඒ සඳහා පොළව තුළ පෙරහන් මුට්ටි කිහිපයක් එක මත එක සිටින සේ තබා තිබුණි

➢ කලා නිර්මාණ

ප්‍රතිමා

- ❖ ගණිත මිනුම් ක්‍රම පිළිබඳ සැලකිලිමති වෙමින් ප්‍රතිමාකරණයට යොමු වී ඇත
- ❖ ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ප්‍රතිමා වර්ග

  බුද්ධ ප්‍රතිමා , බෝධිසත්ව ප්‍රතිමා

  රාජකීය ප්‍රතිමා , වෙනත් ප්‍රතිමා

බුද්ධ ප්‍රතිමා

❖ අනුරාධපුර යුගයේ දී ඉරියව් තුනකින් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට ඇත. උදා:හිඳි පිළිම ,හිටි පිළි , සැතපෙන පිළිම

<u>හිඳි පිළිම</u>

* ධ්‍යාන මුද්‍රාව හා වීරාසන ක්‍රම අනුගමනය කළ හිඳි පිළිම හමු වේ

නිදසුන් -සමාධි බුදු පිළිමය ,තොලුවිල බුද්ධ ප්‍රතිමාව.

<u>හිටි පිළිම</u>

* අනුරාධපුර යුගයේ හමුවන හිටි පිළිම

අවුකන පිළිමය , රැස්වෙහෙර පිළිමය , මාලිගාවිල පිළිමය

* පොලොන්නරු යුගයේදී බුදු පිළිම නෙළීම දියුණු මට්ටමක පැවතුණි.

හිටි,හිඳි, සැතපෙන සෑම ඉරියව්වක ම ප්‍රතිමා දැකිය හැකිය.

උත්තරාරාම හෙවත් ගල් විහාරය ප්‍රතිමා

බෝධිසත්ව ප්‍රතිමා

- ශ්‍රී ලංකාවේ බෝධිසත්ව ප්‍රතිමා නිර්මාණයට යොමු වී ඇත්තේ , මහායාන අදහස් පැතිර යාමත් සමග ජනතාව බෝධිසත්ව ප්‍රතිමා වන්දනාවට යොමු වීම නිසාය
- අනුරාධපුර සමයට අයත් උසස් ගණයේ බෝධිසත්ව ප්‍රතිමාව දඹේගොඩ බෝසත් පිළිමය
- බෝධිසත්ව ප්‍රතිමා දැකිය හැකි ප්‍රදේශ

බුදුරුවගල , වැලිගම කුෂ්ටරාජගල ,යටාලවෙහෙර



රාජකීය හා වෙනත් ප්‍රතිමා

- රුවන්වැලි මහ සෑ මළුවෙන්-

  දුටුගැමුණු රජුගේ ප්‍රතිමාව හා භාතිකාභය රජුගේ ප්‍රතිමාව

- පොලොන්නරු පරාක්‍රම සමුද්‍රය අසල -

  පරාක්‍රමබාහු රජුගේ යැයි ප්‍රකට මූර්තිය

කැටයම් හා මූර්ති කලාව

- ශ්‍රී ලංකාවේ කැටයම් හා මූර්ති කලාව සඳහා ,

  මුල්කාලීනව ඉන්දියානු ආභාසය ලැබුණි

  පසුව මෙරටට ම විශේෂ වූ අනන්‍යතා ලක්ෂණ ඇති විය

- කැටයම්

  සඳකඩපහණ ,මුරගල් , කොරවක් ගල් , පියගැට පෙළ

  ඉසුරුමුණි පෙම් යුවළ ,අශ්ව හිස සහ මිනිසා දැක්වෙන කැටයම

සඳකඩපහණ

- ගොඩනැගිලි ප්‍රවේශ දොරටු ඉදිරියේ තැනූ අඩසඳ හැඩය ගත් ගල් පුවරුවකි
- මුල් කාලීනව කැටයම් රහිත ගල් පුවරුවකි
- පසු අවධියේ කැටයමින් අලංකාර කර ඇත
  - ගල් පුවරුව මැද පිපුණු නෙළුම් මලක අඩක් දැක්වේ
  - ඒ වටා කුඩා ලියවැල් රවුමක් ද,
  - නෙළුම් පොහොට්ටුවක් තුඩින් ගත් හංස පේළියක්,
  - සිංහ ,හස්ති , අශ්ව ,වෘෂභ පෙළක්ද,
  - කෙළවර ගිනිදැල් හෝ පලා පෙති මෝස්තරයක් ,

    ආදි කැටයම් දක්නට ලැබේ.

පොලොන්නරු අවධියේ දී හින්දු බලපෑම මතසඳකඩ පහණින් වෘෂභ රූපය ඉවත් කර ඇත.



❖ මූර්ති

- පාෂාණ හා ලෝහ භාවිත කරමින් බෞද්ධ හා හින්දු මූර්ති නිර්මාණය කර ඇත
- අනුරාධපුර යුගයේ ,

  * ගලින් කළ බුද්ධ ප්‍රතිමා අභයගිරි හා ජේතවන විහාරවලින් හමු වී ඇත

  * ලෝහ වලින් කළ බුද්ධ ප්‍රතිමා වෙහෙරගල අවලෝකිතේශ්වර බෝධි සත්ව ප්‍රතිමාව හා බදුල්ල ලෝහ බුද්ධ ප්‍රතිමාව
- පොලොන්නරු යුගයේදී හින්දු සංකල්ප පදනම් කරගත් ලෝකඩ මූර්ති නිර්මාණ කර තිබේ.

  ශිව , ශිව- නටරාජා , පාර්වතී ,සූර්ය.

චිත්‍ර

- අනුරධපුර යුගයේ සිටම ලංකාවේ චිත්‍ර කලාව පැවතිණි.

  එකල පැවති චිත්‍ර සටහන් වල අවශේෂ හමු වූ ස්ථාන,

  සිතුල්පව්ව , හිඳගල , කරඹගල ,වෙස්සගිරිය ලෙන්

- සම්පූර්ණ චිත්‍ර දැකිය හැකි වන්නේ,

  5වන සියවසට අයත් සීගිරි චිත්‍ර

- පොලොන්නරු යුගයේ දී මෙම චිත්‍ර සම්ප්‍රදාය වැඩි දියුණු වී ඇත.

  දිඹුලාගල මාරවීදිය ,පුල්ලිගොඩ

  පොලොන්නරු ගල්විහාරය , තිවංක පිළිමගෙය



සීගිරි චිත්‍ර

- සීගිරියේ බටහිර ප්‍රාන්තයේ ගල් කෙවෙනි දෙකක චිත්‍ර කිහිපයක් ඉතිරි වී ඇත
- නෙළුම්,උපුල් ,සපු ආදි මල් පැලඳ තව ද ඒ මල් අතින් ගෙන සිටින මනහර ස්ත්‍රී රූප දැකිය හැකිය
- කහ,ගුරු ,රතු හා නිල් යන වර්ණ චිත්‍ර වල මතු වී පෙනේ

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	1	1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව **IV කොටස- වාස්තු විද්‍යාත්මක හා කලාත්මක නිර්මාණ** ඇගයීම

සැකසුම: එච්.කේ. විපුලි මංගලා

බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

1. වාස්තු විද්‍යාව යනු කුමක්දැයි කෙටියෙන් ලියන්න.
2. රජරට ශිෂ්ටාචාර සමයට අයත් වාස්තු විද්‍යා නිර්මාණ බෙදිය හැකි කොටස් දෙක නම් කරන්න.
3. එම කොටස් දෙකට අයත් ගොඩනැගිලි වර්ග දෙක බැගින් ලියන්න.
4. ශ්‍රී ලංකාවේ මුල්ම දාගැබ කුමක් ද?
5. අනුරාධපුර යුගයේ දී අගනගරයෙන් බැහැර ප්‍රදේශවල ඉදි කළ විශාල දාගැබ් 2ක් නම් කරන්න.
6. පොලොන්නරු යුගයේ ඉදිකළ විශාල දාගැබ් 2ක් නම් කරන්න.
7. පහත සඳහන් දාගැබ් කරවූ රජවරු පිළිවෙලින් නම් කරන්න.
   ථූපාරාමය , රුවන්වැලිසෑය, අභයගිරිය , ජේතවනය ,රන්කොත් වෙහෙර
8. මහා පරාක්‍රමබාහු රජතුමා කරවූ දාගැබ් 2ක් නම් කරන්න.
9. අනුරාධපුර යුගයේ මැද කාලය වන විට දාගැබක දැකිය හැනි වූ අංග 3 ක් නම් කරන්න.
10. රජරට සමයට අයත් විශිෂ්ටතම ආයකය නම් කරන්න.
11. චේතියඝර ඉදිකරන ලද්දේ කුමක් සඳහා ද?
12. රජරට සමයට අයත් කලාත්මක වටදාගෙය වන්නේ කුමක් ?
13. බෝධිඝරය යනු කුමක් ?
14. අනුරාධපුරය යුගයට අයත් කලාත්මක බෝධිඝරය නම් කරන්න.

15.පිළිමගෙවල් නිර්මාණය කිරීමේ අරමුණු මොනවා ද?

16.රජරට ශිෂ්ටාචාර සමයේ දී පිළිමගෙවල් නිර්මාණය කළ ප්‍රධාන සම්ප්‍රදායන් 3 නම් කරන්න.

17.එම සම්ප්‍රදායන් දෙකක් සඳහා නිදසුන් දෙක බැගින් ලියන්න.

18.ගල් ලෙන් භාවිතයට සුදුසු පරිදි සකස් කිරීමේ දී කටාරම් කෙටීම සිදු කළේ ඇයි ?

19.පොලොන්නරු යුගයට අයත් ශිව දේවාල පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

20.වර්තමානයේ නටබුන් දැකගත හැකි රජරට ශිෂ්ටාචාර සමයට අයත් විශිෂ්ට රජ මාලිගා 2ක් නම් කරන්න.

21.රජරට සමයේ සැත්කම් සිදු කිරීමට තරම් දියුණු වෛද්‍ය දැනුමක් තිබූ බව සනාථ කරන සාක්ෂිය කුමක් ද?

22.පුරාණයේ ජනතාව පරිසරය කෙරෙහි සැලකිලිමත් වූ බව ඔවුන්ගේ සනීපාරක්ෂක කටයුතු ඇසුරෙන් ලියන්න.

23.අනුරාධපුර යුගයේ නිර්මාණය කරන ලද සුවිශේෂි හිඳි හා හිටි පිළිම දෙකක් නම් කරන්න.

24.පොලොන්නරු යුගයේ සෑම ඉරියව්වකම ප්‍රතිමා දැකගත හැකි ස්ථානයක් නම් කරන්න.

25.අනුරාධපුර සමයට අයත් උසස් ගණයේ බෝධිසත්ව ප්‍රතිමාව කුමක් ද?

26.රුවන්වැලි මහ සෑ මළුවේ දක්නට ලැබෙන රාජකීය ප්‍රතිමා දෙක නම් කරන්න.

27.අනුරාධපුර සමයට අයත් සඳකඩපහණේ දැකිය හැකි අංග නම් කරන්න.

28.පොලොන්නරු සමයේ සඳකඩපහණ නිර්මාණයේදී සිදු කළ වෙනස කුමකු ද?

29.අනුරාධපුර යුගයේ ලෝහ වලින් නිර්මාණය කරන ලද බෝධිසත්ව ප්‍රතිමාවක් නම් කරන්න.

30.අතීත ශ්‍රී ලංකාවේ චිත්‍ර කලාවේ දියුණුව සීගිරි චිත්‍ර ඇසුරෙන් පැහැදිලි කරන්න.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
8	ඉතිහාසය	1	1. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික තාක්ෂණය සහ කලාව **IV කොටස- වාස්තු විද්‍යාත්මක හා කලාත්මක නිර්මාණ** **පිළිතුරු**

සැකසුම: එච්.කේ. විපුලි මංගලා

බප/හො/ඉළිඹ ගාමිණී ක.වි

1. **නිවාස , ගොඩනැගිලි ආදී ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳ හදාරණ ශිල්ප ශාස්ත්‍රයයි.**

2. **ආගමික ගොඩනැගිලි ,ආගමික නොවන ගොඩනැගිලි.**

3. **8 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතෙහි 20 පිටුව බලන්න.**

4. **ථූපාරාමය.**

5. **සේරුවාවිල,සෝමාවතිය,තිස්සමහාරාමය ,මැදිරිගිරිය ,දීඝවාපිය ,නීලගිරිය .**

6. **පොලොන්නරු කිරිවෙහෙර , දෙමළ මහා සෑය, දැදිගම කොට වෙහෙර, යුධඟනාව දාගැබ ,රන්කොත් වෙහෙර.**

7. **8 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතෙහි 21 පිටුව වගුව 1.2 බලන්න.**

8. **8 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතෙහි 21 පිටුව වගුව 1.2 බලන්න.**

9. **පාදම,පේසාවළලු,ගර්භය,හතරැස් කොටුව,දේවතා කොටුව,කොත්කැරැල්ල,කොත,**

10. **මිහින්තලේ කණ්ඨක චේතියේ ආයකය**

11. **ප්‍රමාණයෙන් කුඩා දාගැබ් ආවරණය කිරීම සඳහා තැනූ ගෘහය.**

12. **මැදිරිගිරිය වටදාගෙය.**

13. **බෝධි වෘක්ෂයේ ආරක්ෂාවට,අලංකාරයට හා වන්දනාමාන කරන අයගේ පහසුව සඳහා බෝධි වෘක්ෂය මැදි කොට තනවා ඇති ගෘහය.**

14.කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්කගම බෝධිඝරය.

15.බුදු පිළිම අව්වැසි වලින් ආරක්ෂා කිරීම සඳහා.,වන්දනාමාන කරන ජනතාවගේ පහසුව සඳහා.

16.ගන්ධ කුටි සම්ප්‍රදාය, ගෙඩිගේ සම්ප්‍රදාය., ලෙන් විහාර සම්ප්‍රදාය.

17. ගන්ධ කුටි සම්ප්‍රදාය -කිරිබත් වෙහෙර., විජයාරාමය, පංකුලිය හා තොලුවිල.ගෙඩිගේ සම්ප්‍රදාය.-ථූපාරාමය, ලංකාතිලකය, තිවංක පිළිම ගෙය.

18.වැසි ජලය ලෙන තුළට ඒම වැළැක්වීමට.

19.චෝල වාස්තු විද්‍යා ශෛලය අනුව සම්පූර්ණයෙන්ම ගලින් කර ඇත.

20.අනුරාධපුර සමයට අයත් සීගිරිය,පොලොන්නරු සමයට අයත් වෛජයන්ති ප්‍රාසාදය.

21.පොලොන්නරු ආලාහන පිරිවෙන් ගොඩනැගිලි අතරින් සැත්කම් සඳහා භාවිත කරන උපකරණ හමු වීම.

22.පොළව තුළ පෙරහන් මුට්ටු කිහිපයක් එක මත එක සිටින සේ තබා කැසිකිළි වලින් බැහැර වන අප ජලය එමඟින් පිරිසිදු කර පරිසරයට මුදා හැරීම.

23.හිඳි පිළිමය-අනුරාධපුර සමාධි පිළිමය.

හිටි පිළිමය- අවුකන ප්‍රතිමාව.

24.පොලොන්නරු උත්තරාරාමය හෙවත් ගල්විහාරය.

25.දඹේගොඩ බෝසත් පිළිමය.

26.දුටුගැමුණු රජුගේ හා භාතිකාභය රජුගේ.

27.පිපුණු නෙළුම් මලක අඩක්, කුඩා ලියවැල් රවුමක්, නෙළුම් පොහොට්ටුවක් තුඩින් ගත් හංස පෙළක්.,සිංහ,හස්ති,අශ්ව,වෘෂභ පෙළක් ද, කෙළවර ගිනිදැල් හෝ පලා පෙති මෝස්තරයක් .

28. හින්දු බලපෑම මත සඳකඩපහණින් වෘෂභ රූපය ඉවත් කිරීම.

29. වෙහෙරගල අවලෝකිතේශ්වර බෝධිසත්ව ප්‍රතිමාව.

30 * සීගිරි චිත්‍ර ක්‍රි.ව.පස්වන සියවසට අයත් යැයි සැලකේ.

* නෙළුම් ,උපුල්,සපු ආදි මල් ගත් ස්ත්‍රී රූප දැකිය හැකිය.

* චිත්‍ර වල කහ, ගුරු, රතු හා නිල් වර්ණ මතු වී පෙනේ.